


**මෙම සමාගමේ  කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල පවතින පහත සදහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පී (ඔටෝ සර්විස්) 11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** අධීක්ෂණ නිළධාරින්ගේ  අධීක්ෂණය යටතේ සියළුම සැහැල්ලු වාහන, බරවාහන සහ උපකරණ වල සේවා කටයුතු නිසි පරිදි සිදු කිරිම, දෝෂ තත්වයන් පවතී නම් ඒ පිලිබඳ රියැදුරන සහ අධීක්ෂණ නිළධාරින් දැනුවත් කිරිම.

**රැකියාවේ  වගකීම් :**

1 සියළුම වාහන සහ අදාළ උපකරණ වල පූර්ව නඩත්තු කටයුතු අධීක්ෂණ නිළධාරින්ගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ නිස පරිදි පවත්වා ගෙන යාම.

11 සේවා සථානයේදී රියැදුරන්ගෙන් වාහනය පරික්ෂා කර භාර ගැනිමෙන් පසු වාහනය ධාවනය කර ඇති කිලෝමීටර් ප්‍රමාණය හෝ කාලය අනුව අවශ්‍ය සේවා කටයුත   සිදු  කිරිම.

111 මාරු කිරිමට අවශ්‍ය සියළුම ෆිල්ටර් අධීක්ෂණ මහතා හට භාර දීම, එයාර් ෆිල්ටර් මාරු නොකරන විට ඒවාට හුලං අල්ලා පිරිසිදු කර සවි කිරිම.

1V එන්ජින් ඔයිල්, ගියර් ඔයිල් , ඩිෆරන්ෂිල් ඔයිල් මාරු කිරිමට අවශ්‍ය නම් පමණක් මාරු කිරිම හා ඔයිල් මට්ටම නියමිත පරිදි තැබීමට කටයුතු කිරීම.

V වාහන පරික්ෂාවේදී හදුනා ගනු ලබන  සියළුම විශේෂිත තත්වයන් එනම් තෙල් හා ජලය කාන්දුවීම්, කැඩීම්, ගෙවීම් හා බුරුල්වීම පිළිබඳ අධීක්ෂණ නිළධාරින් හා රියැදුරු මහතුන්  දැනුවත් කිරිම.

VI එන්ජින් ඔයිල් , ගියර් ඔයිල් , ඩිෆරන්ෂිල් ඔයිල් , රේඩියේටර් වතුර හා බැටරි වතුර යනාදියෙහි මට්ටම් පරික්ෂා කර බලා අඩු නම් ඒවා පිරවීම.

VII වාහන වලට යෙදිය යුතු ලිහිසිකරණයන් අවශ්‍ය පරිදි යෙදීම.

VIII හැකි සෑම විටම වාහන වල රෝද ගලවා පිරිසිදු කර තිරිංග පද්ධතියට අදාළ කොටස්වල ගෙවීම් හෝ කාන්දු වීම් තිබේ නම් අධීක්ෂණ නිළධාරින්  හා  රියැදුරන් දැනුවත් කිරිම.

IX තම සේවා කටයුතු වලට අදාළ දෛනික වාර්ථා හා ගබඩා වාර්ථා සටහන් පොත් නිසි  පරිදි පවත්වාගෙන යාම.

X අධීක්ෂණ නිලධාරින් විසින් කලින් කලට පවරන ලබන අනෙකුත් සේවා සඳහා සහභාගී වීම.

xi වාහන සේවා එසවුම් උපකරණය ක්‍රියා කරවීම, එහි නඩත්තුව හා යෝග්‍යතාවය පිළිබඳ හැකියාව හා සැලකිලිමත්භාවය තිබිය යුතු වීම.

Xii තිරිංග පද්ධතියේ හා ක්ලච් පද්ධතියේ ඔයිල් කාන්දු වීම හා බ්රේක් පෑඩ් හා ලයිනර් පරික්ෂා කර බලා තත්ත්ව පරික්ෂණයක් සිදු කිරිම.

xiii වාහන බොඩිය ඇතුලත හා පිටත පිරිසිදු කිරම මෙන්ම වැසිය සෝදා පිරිසිදු කිරීම.

xiv වැඩබිම පිරිසිදුව හා ක්‍රමානුකූලව පවත්වා ගැනීම මෙන්ම උපකරණ වල ආරක්ෂාව තහවුරු වන පරිදි වැඩ කිරීම.

xv රාජකාරී කාලය තුල නිල ඇදුම් පැළදීම හා එම නිල ඇදුම් පිරිසිදුව පවත්වා ගෙන යාම.

**සුදුසුකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ පාඨමාලාවක් සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

(ආ) ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටම (NVQ Level 4) වෘත්තීය සහතියක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සහ**

(ඇ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සිමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :** තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**තෝරා ගැනීමේ ක්‍රමය :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම ස්ථානයක සේවය කල යුතු වේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් පහත සඳහන් ලිපිනයට 2025 **ඔක්තෝබර් මස 27 වන දිනට** පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක් ඉදිරිපත් කල යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **අයදුම්කරන තනතුර** සඳහන් කළ යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ජායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අනුමත මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**